# කුම්භිල ජාතකය

සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්. තමන් වහන්සේ නසන්නට දෙව්දතුන් කළ ව්‍යසනයක් නිසා මහණෙනි! මොහු මා නසන්ට උපක්‍රම යෙදුවේ දැන් මතු නොවෙයි. පෙරත් කළෝ වේදැයි ඉකුත්වත වදළ සේක.

ආරාධනය - භික්ෂූන් වහන්සේ

ජාතක කථාව - මෙම ජාතක පොතේ 54 වන වානරින්ද ජාතක කථාවෙහි මෙනි.
වඳුරු තෙම උපක්‍රම බලයෙන් කුම්භීලයාගෙන් මිදී එගොඩට පැන්න කල්හි කුම්භීලයන් වානරින්දයන් අමතා

යසෙසතේ චතුරො ධම්මා වානරින්ද! යථා තව
සච්චං ධම්මො ධිති චාගො දිඨංසො අති වතතති

පින්වත් වානරින්දය! යමෙකු ලඟ සතය වචනය, ස්ථානෝචිත ප්‍රඥාව, ධෛර්‍යය, ත්‍යාගී බව තිබේද ඔහු නොබියව තම පස මිතුරා (හතුරා) පරදවා ජය ගන්නේය. ඔබද දැන් මාගෙන් මිදුනේ යැයි කියා ගියේය.

එසයෙහි කුම්භිලයා නම් දැන් දෙව්දත් තෙරුන්ය. කුම්භිල ධේනුව නම් චිංචිමානවිකාවෝය. වානරින්දව උපන්නේ බුදුරජාණන් වහන්සේය.